# හිජාබ් ඇඳීම මුස්ලිම් ආගමේ නීතියක්ද?

[ සිංහල – Sinhala – سنهالي ]

සාකච්ඡා මෙහෙයීම

තරංග රත්නවීර

නිරීක්ෂණය: ජාසිම් බින් දඉයාන්

2013 - 1434

IslamHouse.com

# هل الحجاب واجب إسلامي

« باللغة السنهالية »

لقاء صحفي من

## تارنغا راتناويرا

جمعه وراجعه: الداعية جاسم بن دعيان

2013 - 1434

IslamHouse.com

## ඇඟට හිරට කොටට ඇඳල ලෙඩ දාගන්නේ කුමටද? මේ ඇඳුම අපට සැනසිල්ලක්!

## දිවයින ඉන්ටර්විව්

මුස්ලිම්වරුන්ගේ ජීවිතවල බොහෝ දේවල් තීරණය වන්නේ ඔවුන්ගේ ආගමට අනුවය. මුස්ලිම් කාන්තාවන් ජීවත් විය යුතු ආකාරය, අඳින පළඳින හැටි තීරණය කරන්නේද ඉස්ලාම් දහමට අනුකූලවය. එහෙත් මුළු සර්වාංගයම වසාගෙන සිටින මුස්ලිම් කාන්තාවන්ගේ ඇඳුම සමාජයේ විවිධ කතාබහට තුඩු දී තිබෙන විලාසිතාවකි. එහෙයින් මුස්ලිම් කාන්තාවගේ ඇඳුම් විලාසිතාව ගැන අපි මුස්ලිම් කාන්තාවන් කිහිප දෙනකුගෙන් මත විමසුවෙමු. පහතින් පෙළ ගැසෙන්නේ ඔවුන්ගේ අදහස්ය.
ප්රශ්න. ඔබ ඔය ඇඳගෙන ඉන්න ඇඳුමට කියන නම මොකක්ද?

පිළිතුර. මේකට කියන්නේ කබාය කියලා...
ප්රශ්න. ඇඳුමත් හලාල් ද?
පිළිතුර. නැහැ... නැහැ.... සිනාවකි.
ප්රශ්න. ඔය ඇඳුම ඔබට දුකක් නේද?
පිළිතුර. එහෙම හිතන්න එපා. මේ ඇඳුම අපට සැනසිල්ලක්. මේක හරිම පහසුවෙන් ඇඳගන්න

පුළුවන්. හොඳට ඉඩ කඩ තියෙනවා. කබාය කියන්නේ කෝට් එකක්... මේකට යටින් අපි තව ඇඳුමක් අඳිනවා. ඒ ඇඳුම 100% කොටන් නිසා දහදිය දාන්නෙත් නැහැ. සම අව්වට පිච්චෙන්නේ නැති නිසා හමේ පැහැයේ කිසිම වෙනසක් වෙන්නෙත් නැහැ. මගේ සමහර සිංහල යාළුවෝ කියනවා මුළු ඇඟම වහගෙන ඉන්න නිසා ඔයාගේ හමේ අමුතුම ලස්සනක් තියෙන්නෙ කියලා. ඉතිං අපිට ඇඳුම දුකක් වෙන්නේ කොහොමද.
තව එකක් තමයි මුළු ඇඟම වහගෙන ඉන්න නිසා අපේ දිහා කවුරුවත් බලන්නෙ නැහැ. ඒ නිසා අපිට හරිම පහසුවෙන් අපේ ගමන් බිමන් යන්න එන්න පුළුවන්. ඇඟ බාගයක් පේන්න ඇඳුම් ඇඳපු අය වගේම ඇඟටම හිර වෙච්ච ඇඳුම් ඇඳගෙන යන ගෑනු දිහා මහ මගදී පිරිමි බලන්නේ හරිම අමුතු විදිහට. ඒ පිරිමින්ගේ හිත්වල මොකක් හරි සිතුවිල්ලක් ඇති වෙන නිසානේ. ඒ සිතුවිලි පාලනය කර ගන්න බැරි වුණහම තමයි පිරිමි වැරැදි විදිහට හැසිරෙන්න හදන්නෙ. අපි මොකටද අපේ ලස්සන පෙන්වලා කෙනෙකුගේ හිත් අවුල් කරන්නේ. අපිට පුළුවන්නේ සමාජයේ ඇස්වලින් අපේ ඇඟ වහගෙන ඉන්න.
ප්‍රශ්න. කබාය ඇඳීම මුස්ලිම් ආගමේ නීතියක්ද?
පිළතුර. නැහැ... අපේ ආගමේ කිසිම දේකට එහෙම නීති දාලා නැහැ. මේ ඇඳුම අඳින්න අකැමැති නම්

වෙනත් ඇඳුමක් අඳින්න පුළුවන්. නමුත් මුස්ලිම් කාන්තාවන් ඇඳුම් අඳින්න ඕනා මෙන්න මෙහෙමයි කියලා අපේ ආගම නීති හයක් යටතේ පෙන්වා දීලා තියෙනවා. කැමති අයට ඒ නීතිවලට යටත්ව අඳින්න පළඳින්න පුළුවන්. අකැමැති අයට ඒ අය කැමති විදිහට අඳින්න පුළුවන්.
ප්රිශ්න. ඔය කරුණු හය සම්පූර්ණ කරලා ඇඳුම් අඳිනවා කියන්නේ නීතියකට යටත් වෙලා නෙමෙයිද?

පිළිතුර. හරි... ඒත් අපේ ආගමේ මේ විදිහටම අඳින්න ඕනා කියලා බල කරන්නෙ නැහැ. කැමති අයට අඳින්න පුළුවන්. අකැමැති අයට නැඳ ඉන්න පුළුවන්.

ප්රැශ්න. මොනවද ඒ නීති මාලාව...?

පිළිතුර. ඇඟට තදට අඳින්න බැහැ., ගැහැනු පිරිමි වගේ අඳින්න බැහැ, පිරිමි ගැහැනු වගේ අඳින්න බැහැ., මුස්ලිම් ජාතිකයෙක් ජාතියේ අනන්යේතාව තහවුරු වන විදිහට ඇඳුම් අඳින්න ඕනා., මුහුණ සහ අත් දෙකේ මැණික් කටුවට පහළින් හැර මුළු සිරුරම ආවරණය වෙන්න ඕනා., සිරුර විනිවිද පේන විදිහට අඳින්න බැහැ. ඒ කරුණු හය සම්පූර්ණ වන විදිහට අපිට ඕන පාටකින් විලාසිතාවකට ඇඳුම් හදාගන්න පුළුවන්.

ප්රැශ්න. මුස්ලිම් කාන්තාවන්ට අඳින්න පළඳින්න ඉස්ලාම් ආගම විසින් එහෙම නීති මාලාවක් දාලා තියෙන්නෙ ඇයි...?

පිළිතුර.  මේ ලෝකයේ ලස්සනම අය කාන්තාවන්. පිරිමින්ටත් වටිනාම දේ ගැහැනියයි. මේ ගැහැනියකගේ තියෙන ආකර්ෂණීය පෙනුම නිසා තමයි අද සමාජයේ කාන්තාව විවිධ අතවරයන්වලට ලක්වන්නේ. කාන්තාවන් අඳින පළඳින විදිහත් මේ අතවරයන්වලට ඍජුව බලපාල තියෙනවා. අද ලෝකයේ කාන්තා අතවරයන් වැඩියෙන්ම සිදුවෙන්නේ යුරෝපා රටවල. මොකද යුරෝපීය කාන්තාවන් ඒ අයගේ සිරුරුවල අවශ්‍යසම තැන් ටික විතරයි වහාගෙන ඉන්නේ. අරාබි රටවල තමයි කාන්තා අතවරයන් අඩුවෙන්ම වෙන්නේ. එහෙම වෙලා තියෙන්නෙ ඒ කාන්තාවන් ඔවුන්ගේ සුන්දරත්වය වහගෙන ඉන්න නිසයි. හරි විදිහට විනීතව සංවරව ඇඳුම් පැළඳුම් අඳිනවා නම් සමාජයේ මෙච්චරටම කාන්තා අතවරයන්වලට ලක්වෙන්නේ නැහැ.

අපි කෙල්ලෝ දෙන්නෙක්ව උදාහරණයකට ගමු. එක කෙල්ලෙක් මුස්ලිම් විදිහට ඇඳලා, අනිත් කෙනා බටහිර ක්‍ර්මයට කොට සායක් ඇඳලා ඇඟට තද 'ටීෂර්ට්' එකක් ඇඳගෙන පාරෙ යනවා.

කොල්ලෝ වැඩියෙන්ම බලන්නේ කා දිහාද? දෙකක් නැහැ අර කොට සාය ඇඳගෙන යන කෙල්ල දිහානේ. ඉතිං අපි මොකටද එහෙම කැපිලා පේන්න ඇඳගෙන ගිහින් සමාජය තව තවත් දූෂණය කරන්නේ. ඒ වගේම තමයි අද වැඩියෙන්ම පවුල් ප්‍රශ්න ඇති වෙලා තියෙන්නෙත් කාන්තාවන්ගේ විලාසිතා නිසයි. අද කාන්තාවන් විලාසිතා කරන්නේ ගෙදරින් එළියට යනකොට සමාජයට පේන්න. ගෙදර ඉන්නෙ කිළුටු ඇඳුම් ඇඳගෙන. එතකොට නිතරම සමාජයත් සමග ගැටෙන තම ස්වාමිපුරුෂයා මහ මඟදී දකින්නේ වෙනත් ගෑනුන්ගේ සුන්දරත්වය. එහෙම වුණහම ඒ අය හිතනවා අර කෙල්ල කොච්චර ලස්සනද? අන්න ප්‍රශ්නය ඇති වෙන තැන. ඒකයි අපේ ආගමේ කියන්නෙ කාන්තාව විලාසිතා කරන්න ඕනා තමන්ගේ ස්වාමියාට පේන්න විතරයි කියල.

ප්‍රශ්න. මුස්ලිම් කාන්තාවන් වෙනත් පිරිමින් ඉදිරියේ මුහුණ විවර කරන්නේම නැද්ද?
පිළිතුර. තමන්ගේ පියා, සහෝදරයන් සහ මාමලා ඉදිරියේදී මොන ඇඳුම ඇඳගෙන හිටියත් ප්‍ර,ශ්නයක් නැහැ.

ප්‍රශ්න. හරි... සමාජයේ වෙනත් පිරිමින් ඉදිරියේ මුහුණ විවර කරන්නේම නැද්ද?

පිළිතුර. මුහුණ විවර කරන අවස්ථා තියෙනවා. වෛද්‍ය  ප්‍ර තිකාර ගන්න වෛද්‍යසවරයෙක් ළඟට ගියහම. නීතිමය කටයුතු මත මුහුණ විවර කරන අවස්ථාත් තියෙනවා. හැබැයි අපි නම් වෛද්‍ය වරයෙක් ළඟට යන්නෙ අපේ සැමියා හෝ පියා සමගයි.

ප්‍රාශ්න. වෛද්‍යඟමය අවශ්‍යිතා මත මුස්ලිම් කාන්තාවකට ශල්‍යකර්මයක් සිදුකරන්නට වුවහොත් එතකොටත් සැමියා හෝ පියා ශල්‍ය්කර්මය සිදු කරන තැන ඉන්නවද?

පිළිතුර. නැහැ... නැහැ.... වෛද්‍ය්ට ප්‍රටතිකාර මත සම්පූර්ණයෙන්ම ඇඳුම් විවර කරන්න අපේ ආගමෙන් අවසර දීලා තියෙනවා.

ප්‍රෙශ්න. බටහිර පන්නයට අඳින පළඳින මුස්ලිම් කාන්තාවනුත් අපි සමාජයේ දැකලා තියෙනවා.

පිළිතුර. අපි දෙවියන් වහන්සේට ළං වෙන්න වෙන්න සිතට දැනෙන ආශාවල් නැති වෙලා යනවා. ලස්සනට ඉන්න ඕන කියලා හිතෙන අය එහෙම අඳිනවා ඇති. එක එක අයගේ සිතුම් පැතුම් විවිධයි නේ. ඕනෑම ජාතියක, ආගමක එහෙම අය ඉන්නවා.
ප්‍රනශ්න. කබාය අමතක කරන අයට ඉස්ලාම් ආගම මොන වගේ පියවරක්ද ගන්නේ...

පිළිතුර. කිසිම දෙයක් කරන්නේ නැහැ... ඒ අයගේ කැමැත්තට අනුව ඕනෑම දෙයක් කරන්න පුළුවන්. හැබැයි ඒ අයව හරි මඟට ගන්න උපදෙස් දෙනවා. අපේ ඇඳුමේ තියෙන වටිනාකම තේරුම් කරලා දෙනවා.

ප්රවශ්න. ඔබ කිව්වා නීති මාලාවට යටත්ව ඕනෑම විලාසිතාවකට ඇඳුම් හදාගන්න පුළුවන් කියලා. නමුත් මුස්ලිම් කාන්තාවන් වැඩියෙන්ම අඳින්නෙ කළු පාට ඇඳුම්නේ..

පිළිතුර. ඇත්ත... කළු කියන්න ඇස්වලට ප්රිිය නැති පාටක්. ඉතිං අපි කළු පාට අඳිනකොට සමාජයේ ඇස් කොහෙත්ම අප දෙසට එන්නේ නැහැ. ඒකයි අපි කළු පාට තෝරගන්නේ. නැතුව කළුම අඳින්න ඕනා කියලා ඉස්ලාම් ආගමේ කොතනකවත් කියලා නැහැ.

ප්රශ්න. මුහුණයි, දෑතේ මැණික් කටුවට පහළින් නිරාවණය කරන්න පුළුවන් කියලා ඔබ කිව්වා. ඒත් සමහර මුස්ලිම් කාන්තාවන් ඇස් දෙක පේන්න අනිත් සියලුම තැන් වහගෙනයි පාරෙ යන්නේ...?

පිළිතුර. කෙනකුගේ ලස්සන වැඩියෙන්ම පේන්නෙ මුහුණෙ. ඊළඟට ඔළුවේ හිස කෙස්. එහෙම නම්

අපේ අය අනිවාර්යෙන්ම මුහුණ සහ ඔළුව ආවරණය කරන්නම ඕනා. ආගමට භක්තිමත් කාන්තාවන් අඳින්න පළඳින්න ඕනා එහෙම තමයි. ක්රි්ස්තියානි ආගමේ සිස්ටර් කෙනෙක් වුණත් දෙපා වැහෙන්නම ලොකු ඇඳුමක් ඇඳලා කකුල්වලට මේස් දෙකකුත් දානවා. හිස කෙස් ආවරණය කරනවා. අපේ ආගමේ කියන්නේ සියලුම මුස්ලිම් ජාතිකයන්ට පුළුවන් දෙවියන්ට ළං වෙන්න. ඒ නිසා අපි ඒ විදිහට අඳිනව පළඳිනවා.

ප්රිශ්න. මුහුණ ආවරණය කරන විලාසිතාවට මොකක්ද කියන්නේ...?

පිළිතුර ඒකට කියන්නෙ පර්දාව දානවා කියලයි. හිස කෙස් වහන ඒකට කියන්නෙ නිකාස් කියලයි.

ප්ර්ශ්න. ඔබලා පුංචි කාලෙ ඉඳලම කබාය අඳින්න ඕනද?

පිළිතුර. නැහැ... වැඩිවියට පත් වුණහම තමයි එහෙම අඳින්න ඕනා. එතකොටනේ කෙල්ලෙකුව හොඳටම ලස්සනට පෙන්නෙ.

ප්රනශ්න. මුස්ලිම් රටවල් අතර මේ ඇඳුම් විලාසිතාව වෙනස් වෙනවද?

පිළිතුර. නැහැ... පොඩි පොඩි වෙනස්කම් තියෙනවා. නමුත් ඉස්ලාම් ආගමේ නීති හය සෑම මුස්ලිම් කාන්තාවකටම පොදුයි.

ප්රශ්න. ශමුස්ලිම් කාන්තාවන් විදිහට කළු කබාය ඇඳගෙන සමාජයේ අකටයුතුකම් කරන්න පහසුයි කියලා මතයක් තියෙනවා. පසුගිය දිනක මුස්ලිම් කාන්තාවක් විදිහට මුළු සිරුරම වහගෙන බැංකුවක් කොල්ල කන්න පැමිණි පුද්ගලයා ඊට කදිම උදාහරණයයි.

පිළිතුර. අපිට ආරක්ෂකක හේතූන් මත මුහුණ පෙන්වන්න පුළුවන්නෙ. එතකොට ඒ බැංකුවේ ආරක්ෂනක නිලධාරීන් ඉන්න ඇතිනේ. ඒ අයට කියන්න තිබුණානේ ඒ පුද්ගලයාට ආරක්ෂනක හේතූන් මත මුහුණ ඇරලා පෙන්වන්න කියලා. එහෙම කළා නම් පහසුවෙන් ඒ පුද්ගලයාව කොටු කරගන්න තිබුණානේ. එතකොට කවුද වැරැදි? එහෙම ඇඳගෙන යන අපිද? ආරක්ෂ ක නිලධාරීන්ද?

සෞදි අරාබිවල හැම කාන්තාවක්ම සම්පූර්ණයෙන්ම මුළු සිරුරම වහලා තමයි අඳින්නේ. එතකොට ඒ රටේ මීට වඩා අපරාධ වැඩි වෙන්න ඕනා නේ. එහෙම දෙයක් වෙලා නැහැනේ. අපි මේ විදිහට ඇඳුම් ඇඳගෙන පාරෙ ගියා කියලා

සමාජයට හොඳක් මිස නොහොඳක් වෙන්නේ නැහැ.

ප්රමශ්න. දැන් ඔබ මෙහෙම මුළු සිරුර කළු කබායකින් වහගෙන පාරෙ යන කොට අපහසුතාවලට ලක්වුණු අවස්ථා නැද්ද?

පිළිතුර. නැහැ.. කවදාකවත් මෙහෙම දෙයක් වෙලා නැහැ. අඩුම තරමින් චෙක් පොයින්ට් එකකදීවත් මට මුහුණ පෙන්වන්න කියලා නැහැ. ගුවන් තොටුපළවලද එහෙම අපිට විශේෂ සැලකිල්ලකුත් තියෙනවා.

ප්රෙශ්න. මුස්ලිම් කාන්තාවන්ගේ ඇඳුමෙන් ඇඟ සම්පූර්ණයෙන්ම වැහිලා නිසා දහදිය පිටවීම අඩු වෙලා දහදිය දුගඳක් හමනවා කියලා සමාජයේ මතයක් තියෙනවා...?

පිළිතුර. එහෙම වෙන්නෙ නැහැ.. කබාය කියන්නෙ හොඳට ඉඩකඩ තියෙන ඇඳුමක්. එහෙම නිසා අපේ ඇඟේ රස්නය හොඳට පිට වෙනවා. ශරීරය ඇරගෙන ඉන්නකොට තමයි පරිසරයේ තියෙන විෂ දූවිලි හමේ රැඳීලා සමේ කුෂ්ට දාන්නේ. දහදිය ගඳ හමන්නෙ. මෙහෙම වහගෙන ඉන්න කාන්තාවන්ගේ මුහුණෙ පිම්පල් දාන්නේ නැහැ. අනිත් එක තමයි මුස්ලිම් මිනිස්සු දවසට පස්

වතාවක් ආගම කියනවා. ඒ ආගම කියන්න කලින් අනිවාර්යෙන්ම කකුල් අත-පය, මුහුණ හොඳින් පිරිසිදු කරනවා. එතකොට අපි කොච්චර පිරිසිදුද?

ප්ර්ශ්න. ඔබ කියන එක ඇත්ත වෙන්න ඇති... නමුත් සමාජයේ මතයක් තියෙනවා මුස්ලිම් කාන්තාවන්ගේ ඇඳුම නිසා අසාමාන්යහ දහදිය දුගඳක් හමනවා කියලා...?

පිළිතුර. මිනිස්සු අපි දිහා බලන්නෙ වපරැසින්... ඒ අයට ඕන දෙයක් කියන්න පුළුවන්... අපේ ඇඳුම අපිට හොඳයි. මේ විදිහට අඳින එක අපේ හිතටත් සැහැල්ලුවක්.

ප්රැශ්න. සමාජයේ වෙනත් කාන්තාවන් වගේ ඔබලා රූපලාවන්යක කරන්නේ නැද්ද?

පිළිතුර. රූපලාවන්යද කරනවා. කාන්තාවන්ට පමණක් සීමා වුණු අපේ පාටි තියෙනවා. ඒ පාටිවලදී අපිට ඕන විදිහට විලාසිතා කරන්න පුළුවන්.

ප්රටශ්න. අද විවිධාකාර විලාසිතා තරග තියෙනවා. මුස්ලිම් කාන්තාවන් ඒ තරගවලට ඉදිරිපත් වෙන්නෙ නැද්ද?

පිළිතුර. කොහෙත්ම නැහැ... අනිවාර්යෙන්ම ඒක අපේ ආගමෙන් තහනම් කරලා තියෙන දෙයක්.
ප්රිශ්න. ඉතිං ඔබ බොරුනේ කියන්නෙ... මුස්ලිම් කාන්තාවන්ට අඳින්න පළඳින්න වගේම ඔවුන්ගේ බොහෝ කටයුතුවලට ඉස්ලාම් ආගමෙන් තහංචි පනවලානේ තියෙන්නේ...?

පිළිතුර. නැහැ... නැහැ... අපේ ආගමේ එහෙම තහංචි දාලා නැහැ. නමුත් මුස්ලිම් කාන්තාවක් විලාසිතා තරගවලට ඉදිරිපත් වෙන්නෙ නැහැ...

ප්රවශ්න. දැන් ඔබ කිව්වා නේ ආගමෙන් තහනම් කරලා තියෙන්නෙ කියලා...?

පිළිතුර. එහෙම නෙමෙයි... අපේ ආගමෙන් කිසිම දේකට නීති දාලා නැහැ. මේවා මේ විදිහට කරන්න හොඳ නැහැ කියලා පෙන්වා දීලා තියෙනවා.

ප්ර ශ්න. අද බොහෝ කාන්තාවන් ව්යාායාම කරනවා. මුස්ලිම් කාන්තාවන් එහෙම ව්යාකයාම කරන්නෙත් කළු කබා ඇඳගෙනද...?

පිළිතුර. කාන්තාවන්ට පමණක් සීමා වුණු ජිම් අද ඕනා තරම් තියෙනවා. එහෙම තැන්වල ඉන්නෙත් කාන්තා පුහුණුකාරියන්මයි. ඉතිං අපි එහෙම තැන්වලට ගිහින් ව්යාුයාම කරනවා. නැත්නම්

අපේ ඇඳුම ඇඳගෙන මගතොටේ වුණත් ඇවිදලා ව්යා.යාම කරන්න පුළුවන්. ව්යාදයාම, කරාතේ, ස්විමිං කරන්න කිසිම බාධාවක් නැහැ. ඒවාට අඳින්න අපිට වෙනම ඇඳුම් පවා තියෙනවා.

ප්රමශ්න. ඒ ඇඳුම් මොනවද?
පිළිතුර. දිග කලිසමක් සහ අත්දිග ටීෂර්ට් එකක්. ඒ ටීෂර්ට් එකේම ඔළුව වැහෙන්නත් කෑල්ලක් තියෙනවා. ස්විමින් කරන්න අඳින්නෙත් සම්පූර්ණයෙන්ම සිරුර ආවරණය වුණු ඇඳුමක්. ඒත් ප්රපසිද්ධියේ ස්විමින් කරන්නේ නැහැ. කාන්තාවන්ට පමණක් සීමා වුණු පූල්වල විතරයි අපි ස්විමින් කරන්නේ.

ප්ර්ශ්න. දැන් දැන් බොහෝ මුස්ලිම් කාන්තාවන් කබාය අතහරිමින් බටහිර පන්නයට අඳින්න පළඳින්න පුරුදු වෙලා නේද?

පිළිතුර. නැහැ... නැහැ... එන්න එන්න මුස්ලිම් කාන්තාවන් මේ ඇඳුමට හුරු වෙනවා. සමාජය වැරැදි පැත්තට යනකොට මුස්ලිම් ජනතාව හරි පැත්තට ගමන් කරමින් ඉන්නවා.

තරංග රත්නවීර